# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/81 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නුවර එළිය ශාන්ත ෆැන්සිස් සේවියර් දේවස්ථාන පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ''නුවර එළිය ශාන්ත ෆැන්සිස් සේවියර් දේවස්ථාන පූජාභූමිය'' යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

***ශාන්ත සේවියර් දේවස්ථාන පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මිනින්දෝරු ජනරාල්ගේ 2012 දෙසැම්බර් මස 19 වැනි දින අංක NU/NEW/2012/180 දරන අනුරේඛනයේ නිරූපිත මධ්‍යම පළාතේ, නුවර එළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවර එළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, නුවරඑළිය ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි කැබලි අංක A යනුවෙන් සඳහන් වූ හෙක්ටයාර් 1.5494 ක් විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු භූමි ප්‍රදේශය.

**කැබලි අංක A සඳහා මායිම් පහත පරිදි වේ :–**

| | | |
|---|---|---|
| උතුරට | : | ඇළ සහ ඔබේසේකර භුක්ති විඳින ඉඩම; |
| නැගෙනහිරට | : | කිනාන් පාර, ශාන්ත ෆැන්සිස් සේවියර් පාර සහ ලෝන්ග් පාර; |
| දකුණට | : | කිනාන් පාර, ශාන්ත ෆැන්සිස් සේවියර් පාර සහ ලෝන්ග් පාර, සාප්පු සංකීර්ණය, උඩුපුස්සැල්ලාව පාර සහ ශාන්ත ඇන්ඩෲස් පාර; |
| බස්නාහිරට | : | ශාන්ත ඇන්ඩෲස් පාර, ඇළ, රාජ්‍ය දැව සංස්ථා ඉඩම, ශාන්ත ෆැන්සිස් සේවියර් පාර, අඩි පාර සහ ඇළ. |

09 - 504

1A - G 20179 — 50 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*